# ජංගම බැංකු ක්‍රමයේ භාවිතය සහ එහි ප්‍රවණතා ( මහජන බැංකුව ඇසුරෙන් )

ඩබ්. පී. ඒ. එස්. විජේසේකර[1]

## සංක්ෂේපය

අතැති මුදල් භාවිතය අවම කිරීමට රිසි සමාජයක මූල්‍ය බැංකු ශාඛාවල ගනුදෙනු සඳහා සිය වටිනා කාලය වැය කිරීමට ජනතාවගෙන් බහුතරයක් අකැමැතිය. මෙයට විසඳුමක් ලෙස බැංකු ගනුදෙනුවල පහසුව සහ කාර්යක්ෂමතාවය උදෙසා මොබයිල් බැන්කින් සේවාව හඳුන්වා දෙන ලදී. සමීක්ෂණයේ ප්‍රධාන අරමුණ වූයේ, මොබයිල් බැන්කින් සේවාව භාවිතය සහ එහි ප්‍රවණතා පිළිබඳව අධ්‍යයනය කිරීමයි. එය මහජන බැංකුව ඇසුරෙන් සිදු කරන ලදී. ( Peoples Mobile Banking ) කොළඹ දිස්ත්‍රික්කයෙන් අහඹු නියැදීම් ක්‍රමයට පුද්ගලයින් 50ක් දත්ත දායකයින් ලෙස යොදාගනිමින් ප්‍රශ්නාවලියක් මගින් ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදී. ඒ අනුව වයස් මට්ටම් සැලකුවිට අවු. 36 - 44 වයසේ පසුවන්නන් වැඩි ප්‍රමාණයක් මොබයිල් බැන්කින් සේවය භාවිතා කරයි. ඒ සමස්තයෙන් 41%කි. පුරුෂයින්ගේ පීපල්ස් මොබයිල් බැන්කින් භාවිතය 65%ක් වන අතර ස්ත්‍රීන්ගේ එය 35%ක් බව අනාවරණය විය. මහජන ජංගම බැංකු ඩයලොග් ආසිආටා (Dialog Axiata ) පරිශීලකයින් සඳහා ද මහජන කෙටි පණිවිඩ බැන්කින් මොබිටෙල් ( Mobitel) පාරිභෝගිකයින් සඳහා ද වන අතර ඩයලොග් පාරිභෝගිකයින් 55% ක් සහ මොබිටෙල් පාරිභෝගිකයන් 45% ක් මේ සඳහා ලියාපදිංචි වී ඇත. ඉන් බොහෝ පිරිසක් ගිණුමේ හර - බැර SMS මගින් පමණක් ලබා ගන්නන් වේ. මහජන බැංකුවේ මොබයිල් බැන්කින් සේවය පිළිබඳව දැනුවත් ප්‍රමාණය 70%ක් වන අතර නොදැනුවත් ප්‍රමාණය 30%කි. මහජන ජංගම බැංකු - සේවය පිළිබඳව පාරිභෝගික තෘප්තිය සැලකූ විට ඒ සඳහා 60%ක් තෘප්තිමත් වන අතර 10%ක් විවේචනය කරති. එම සේවාව පිළිබඳව විශේෂිත මතයක් නොදරන පිරිස 30%කි. මේ අනුව සමස්ත සමීක්ෂණයෙන් පෙනී යන්නේ මහජන ජංගම බැංකු භාවිතය පිළිබඳව බහුතර දැනුවත් පිරිසක් සිටින බවයි. එමෙන් ම ප්‍රධාන ප්‍රවණතාවයක් ලෙස කාන්තාවන්ට සාපේක්ෂව මැදි වයසේ පසුවන පිරිමි පාර්ශවය බහුල ලෙස එය භාවිතා කරන බව හෙළි විය.

**මුඛ්‍ය පද :** මොබයිල් බැන්කින් (Mobile Banking ) , මූල්‍ය බැංකු, බැංකු ගනුදෙනු

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, anjlee816@gmail.com